# දඟ යාළුවෝ බය වෙලා



දැහැමි නිමාෂා රත්නායක

දඟ යාළුවො බය වෙලා

දැහැමි නිමාෂා රත්නායක

විශ්වෝදා ජාතික පාසල

කුරුණෑගල

කතෘගේ වෙනත් කෘති

★ චුට්ටිට හරි හිනා  (2023 රාජ්‍ය සාහිත්‍ය සම්මාන සඳහා නිර්දේශිත)

★ අපට අහිමි පොඩ්ඩිගේ ලෝකය

ISBN අංකය **978-624-206-673-8**

දැහැමි නිමාෂා රත්නායක

ඉහළගම

පිලැස්ස

071 8153006

# පෙරවදන

අධ්‍යාපනයෙන් ඵලදායී පුරවැසියෙකු සතුටින් ජීවත්වන පවුලක් මෙන්ම ප්‍රඥා සම්පන්න දැනුමෙන් යුත් බහුවිධ කුසලතාවන්ගෙන් සපිරි පුරවැසියන් සහිත සමාජයක් ගොඩනැගීම අපේක්ෂාවයි. එසේ නම් පාසලට වගකීම් පවරන දරුවාගේ විභවතා හඳුනාගෙන ඒවා ඔපවත් කිරීම තුළින් ගෝලීය සමාජයට ගැලපෙන ලෙස හැඩගැස්වීම අපගේ වගකීමයි. එම ජාතික අරමුණු මෙන්ම පාසලේ දර්ශනයට අනුව යමින් අපගේ මගපෙන්වීම යටතේ ලේඛනකරණය සහජයෙන් උරුම කරගත් මහමායා දියණියන් වසර ගණනාවක සිට විවිධ අරමුණු පෙරදැරි කොටගෙන ග්‍රන්ථකරණයට යොමු කිරීමේ ප්‍රතිඵලයක් ලෙස දේශීය සාහිත්‍ය කෙතේ ලේඛක අංකුර දහස් ගණනක් වැපිරීමට ලැබීම පාසලක් වශයෙන් ලැබූ සුවිශේෂී ජයග්‍රහණයක් මෙන්ම කාලීන ජාතික අවශ්‍යතාවයක් සපුරාලීමකි.

එහි ඉදිරි දිගුවක් ලෙස පාසල තුළ ගොඩනැගී ඇති පොත් ලිවීමේ සංස්කෘතිය මෙවර ඩිජිටල් තාක්ෂණික යුගයේ ස්මාර්ට් දරුවන්ට ගැලපෙන ලෙස නවීකරණය කරමින් " දිවිය දිනන විද්‍යුත් පොතක් " ව්‍යාපෘතිය හඳුන්වා දෙන ලදී. දරුවන්ට අත්දැකීම් සමුදායක් මෙන්ම ගත්කතුවරයෙකු වීම හරහා ජීවිතයට එකතු වන වටිනාකම සළකා අධ්‍යාපන අමාත්‍යාංශ අනුමැතියෙන් රටේම පාසල් දරුවන් අතර විද්‍යුත් පොතක් ලියන්නට සිහින දකින දරුවන් සහෝදරත්වයෙන් අප හා එක්වීම අගය කරමි.

2023 සාහිත්‍ය මාසයට සමගාමීව අප පාසල විසින් සංවිධානය කළ " දිවිය දිනන විද්‍යුත් පොතක් " ව්‍යාපෘතියට එක්වූ පුංචි ලේඛක ලේඛිකාවන්ට මෙම කෘතිය තුළින් ලැබුණු අත්දැකීම් ඉදිරි අධ්‍යාපනයට මෙන්ම අනාගත දිවියට ශක්තියක් වේවායි ප්‍රර්ථනා කරමු.

මෙම ව්‍යාපෘතිය වෙනුවෙන් සහාය දැක්වූ අප පාසලේ කළමනාකරණ මණ්ඩලය  ගුරුභවතුන් දෙමාපියන් ආදි ශිෂ්‍යාවන් සෙසු පාසල්වල දරුවන් යොමු කළ විදුහල්පතිවරුන් ගුරුභවතුන් මෙන්ම නන් අයුරින් උදවු උපකාර කළ සැමට හෘදයාංගම ස්තුතිය මෙමගින් පිරිනමමි.

ශෂිකලා සේනාධීර

විදුහල්පතිනිය

මහමායා බාලිකා විද්‍යාලය

2023 11 01

## දඟ යාළුවො බය වෙලා

මෙනුදි අඹ ගහ යට බංකුවට වෙලා පුංචි මල් කිනිත්තක් මහනවා ලේන්සුවකට. පුංචි පූස් සූකිරි මෙනුදි ළඟට වෙලා ඉඳගෙන හිටියා. සූකිරිට හරිම කම්මැලියි. සූකිරි නැගිට්ටා. අතපය දිගහැරියා. මෙනුදිගෙ ඔඩොක්කුවට අත් දෙක තියලා මූණ දිහා බලාගෙන හිටියා.

මෙනුදි දැක්කා පුංචි පූස් බලාගෙන ඉන්නවා. ඒත් කතා කරන්න ගියොත් මේ වැඩේ කර ගන්න ලැබෙන්නේ නෑ. ඒක නිසා නොදැක්කා වාගෙ බිම බලාගෙන ලේන්සුව මහමින් හිටියා.

" ඤාව්"

"ආ සූකිරි මොකද?"

"සෙල්ලමක් කරමුද?"


"අනේ මම මේක මහනවනේ අර ටොමීව අඬගහ ගන්නකෝ"

"අනේ චුට්ටම චුට්ටක් සෙල්ලම් කරමුකෝ"

මෙනුදි ඇහුනෙ නෑ වගේ දිගටම ලේන්සුව මැහැව්වා.

"අනේ  චුට්ටම චුට්ටක්" පුංචි සූකිරි ආයමත් කිව්වා

"මට බෑ කීවනෙ දැන්" මෙනුදි ටිකක් සැරෙන් කිව්වා.



පුංචි සූකිරිගෙ ඇස්වල කඳුළු පිරුණා. සද්ද නැතුව ආපහු බංකුව උඩින් වාඩි වුණා. මෙනුදි හොරැහින් සූකිරි දිහා බැලුවා. සූකිරිට හොඳටම දුක හිතිලා වගෙයි. පුංචි මෙනුදිටත් දුක හිතුණා.

"මම එනකල් ටොමීව අඬගහලා දෙන්නද ඔයාට සෙල්ලම් කරන්න?"

පුංචි සූකිරි අසරණ විදියට ඔළුව වැනුවා.

"ටොමී, කෝ මෙහාට එන්න මේ සූකිරිත් එක්ක ටිකක් සෙල්ලම් කරන්න මාත් එන්නම් තව චුට්ටකින්"

පුංචි ටොමී කූඩුව ඇතුළේ ඉඳලා එළියට ආවා. සූකිරිට හරිම සතුටුයි.

"අපි මොකද කරන්නේ?" ටොමී ඇහුවා.

"හැංගිමුත්තන් කරමුද?" සූකිරි කිව්වා


"අපෝ මට නම් බෑ මාව අහු වෙනවා එකපාරින්ම"

"එහෙම නම් ගස් නගිමු ද?"

"මං කොහොමද ගස් නගින්නේ?"

"ම් ...................... එහෙනම්......................"

"අපි අල්ලන සෙල්ලම් කරමුද?" ටොමී ඇහුවා.



“ඒක හොඳයි හැබැයි ඔන්න රිදෙන්න අල්ලන්න නම් එපා” සූකිරි කල් ඇතුවම කිව්වා.

“මමයි ඉස්සරලා දුවන්නේ” කියලා සූකිරි මිදුල පුරා දුවන්න පටන් ගත්තා.

ටොමී සූකිරි පස්සෙන් පැන්නුවා. ටොමී සූකිරිට ළං වෙනකොටම සූකිරි නැවතුණා. දුවගෙන ආපු වේගෙට එක පාරටම ටොමීට නතර වෙන්න බැරි වුණා. ටොමී සූකිරි පහු කරගෙන තවත් ඉස්සරහට දිව්වා. ඒ අතරේ සූකිරි දුවලා ගිහින් පේර ගහට නැංගා.

“බෑ බෑ එහෙම ගස් උඩ නගින්න බෑ” ටොමී ගෝරණාඩු කළා.


“පුළුවන්නම් අල්ලන්න මාව” සූකිරි පේර අත්ත උඩට වෙලා ඔච්චම් කළා.

ටොමී එහෙට මෙහෙට පැනලා සූකිරිව අල්ලන්න හැදුවා. ඒත් බැරි වුණා. ටිකක් උඩ පැනලා බැලුවා. ඒත් බැරි වුණා. ටොමීට ලැජ්ජා හිතුණා.

“මට නම් බෑ ඔයත් එක්ක සෙල්ලම් කරන්න ගහ උඩටම වෙලා ඉන්න එකයි ඇත්තේ” කියලා ටොමී ආපහු ගිහින් මෙනුදි ළඟ බිම දිගා වුණා.

“මොකද සෙල්ලම් කරලා ඉවරද?” මෙනුදි ඇහුවා. ටොමී තරහින් ඔරවලා අහක බලා ගත්තා. සූකිරි ටිකක් වෙලා පේර අත්තට වෙලා බලාගෙන හිටියා. ටොමී ආපහු එන පාටක් නෑ.

“අපරාදෙ ටොමීට අල්ලගන්න පුළුවන් වෙන්න ඉන්නයි මට තිබුණේ ටොමී ආය එන්නෙ නැතිවෙයි මං එක්ක සෙල්ලම් කරන්න” පුංචි සූකිරි ගහෙන් බැහැලා හෙමින් හෙමින් ටොමී හිටපු තැනට ආවා.



“අපෝ ඔයාට විහිළුවක්වත් තේරෙන්නේ නෑනෙ” සූකිරි කිව්වා.

“පුතේ තේ බොන්න එන්නෝ ” මෙනුදිගෙ අම්මා ගේ ඇතුළේ ඉඳලා මෙනුදිට කතා කළා.

“මේ එනවා” කියලා මෙනුදි මහ මහ හිටපු ලේන්සුව බංකුව උඩින් තියලා ගෙදර දිහාවට ගියා. සූකිරි තව ටිකක් ටොමීට කිට්ටු වෙලා පුරු පුරු කිව්වා. ටිකක් වෙලා මූණ දිහා බලාගෙන ඉඳලා


“එහෙනම් අපි බෝල ගහමුද?” කියලා ඇහුවා. ඒත් ටොමී සද්දයක් නෑ.

“අපි බෝල ගහමුද?” සූකිරි ආයෙත් ඇහුවා.

“ඔයා තරහද මං එක්ක?” ටොමී සද්දයක් නැති නිසා සූකිරි දුකින් ඇහුවා.

බොරුවට තරහ වෙලා වගේ හිටපු ටොමීට දුක හිතුණා පුංචි සූකිරි ගැන.

“හා එහෙනම් ගහමුකෝ”කියලා ටොමී බංකුව උඩ තිබුණු මෙනුදිගෙ නූල් බෝලෙ අරන් සූකිරිට දමලා ගැහුවා. නූලෙ කොන ටොමීගෙ පැටළිලා තිබුණ නිසා නූල දිග ඇරිලා නූල් බෝලේ සූකිරි ළඟට පෙරළිලා ගියා.



සූකිරි ඒක අල්ලලා  ටොමීට දානකොට එක නූලක් සූකිරිගෙ පැටළුණා

 නූල් බෝලෙ තවපාරක් පෙරළිලා ටොමී ළඟට ගියා.

ටොමී නූල් බෝලෙත් අරන් සූකිරි වටේ දිව්වා. දැන් සූකිරි නූල් බෝලෙ පැටළිලා සූකිරිට හරිම සතුටුයි.

ඇයි ටොමීට ?

දෙන්නා බිම පෙරළි පෙරළී නූල් බෝලේ එක්ක සෙල්ලම් කළා.



එහා ගෙදර රතු කිකිළි වැටෙන් පැනලා මේ පැත්තට ආවා. ටොමීට කරකර හිටපු සෙල්ලම අමතක වුණා. ටොමී සූකිරිව අතෑරලා රතු කිකිළි පස්සෙන් පන්නන්න පටන් ගත්තා. ටික වෙලාවක් තනියම නූල් බෝලෙ එක්ක සෙල්ලම් කරපු සූකිරි වටපිට බැලුවා. සූකිරිට එහෙට හැරෙන්නත් බෑ. මෙහෙට හැරෙන්නත් බෑ. නැගිටින්නත් බෑ. පෙරලෙන්නත් බෑ. හොඳටම නූල් බෝලේ පැටළිලා.


"දැන් මොකද කරන්නේ?" සූකිරි හොඳටම බය වුණා.

ටොමී ආපහු එනකොට සූකිරි නූල් බෝලෙ පැටළිලා. ලෙහෙලා දෙන්න හැදුවත් කොහෙද? ටිකක්වත් බුරුල් කර ගන්න බැරි වුණා. ටොමී මහ හයියෙන් බුරන්න පටන් ගත්තා. ටොමීගෙ සද්දෙ ඇහිලා මෙනුදි එළියට දුවගෙන ආවා. ටොමී බුරනවා අමුතු සතෙකුට. මෙනුදි තව ටිකක් ළං වෙලා බැලුවා.

"අනේ! පුංචි සූකිරි නූල් බෝලෙ පැටළිලා. "

"අපොයි මේ මොකද කර ගත්තේ?" මෙනුදි ඇහුවා. කාගෙන්වත් උත්තරයක් නෑ.

"මොකද වුණේ?" මෙනුදි ආයෙත් ඇහුවා.




"සූකිරි නූල් බෝලෙ පැටළුණා" ටොමී බයෙන් බයෙන් කිව්වා.

මෙනුදි මට ගහයිද සූකිරිටත් බය හිතුණා.

"අනේ මගෙ පුංචි සූකිරියෝ ඔයාට මොකද මේ වුණේ?"

කියලා මෙනුදි සූකිරිව වඩා ගත්තා. පුංචි ටොමී හොඳටම බය වෙලා සූකිරිට මොනවහරි කරදරයක් වෙයිද කියලා. ටොමී මෙනුදිගෙ කකුළෙ පැටලි පැටලි කෙඳිරි ගෑවා.




"ටිකක් එහාට වෙලා ඉන්නකො ටොමී මම සූකිරිව ලිහා ගන්නකල්"

මෙනුදි ටොමීව එහාට තල්ලු කරලා බංකුවෙන් වාඩිවුණා. මෙනුදි බංකුවේ පැත්තක තිබුණු කතුර අතට ගන්නකොටනම් සූකිරි හොඳටම බය වුණා.

"අනේ මගෙ ලස්සන රැවුල් ගස් ටික නම් කපන්න එපා" සූකිරි කෙඳිරි ගෑවා.

"නෑ මං දැන් මේ රැවුළ කපන්න තමයි හදන්නේ" කියලා මෙනුදි කතුරෙන් හෙමින් හෙමින් නූල් පොටවල් ටික කපලා දැම්මා. දෙතුන් පොළකින් කපනකොට ඔන්න සූකිරිට ටිකින් ටික බුරුලක් දැනුනා. අන්තිමට සූකිරි බේරා ගන්නකොට ඉතිරිවෙලා තිබුණේ නූල් කෑළි ටිකක් විතරයි.

ටොමීට බය හිතුණා මෙනුදි සූකිරිට බනීද කියලා.



“මමයි ඉස්සරලම සූකිරිට නූල් බෝලෙන් දමලා ගැහුවෙ” ටොමී බිම බලාගෙන කිවවා.

“ඒ වුණාට මම ටොමීට නූල් බෝලෙ දානකොට තමයි පැටළුණේ” සූකිරි කිවා.

“ඒ වුණාට මමනෙ ඔයාලට සෙල්ලම් කරන්න කියලා ඔයාලව තනියම දාලා ගෙට ගියේ”මෙනුදි කිව්වා.

“දැන් කොහොමද ලේන්සුව මහන්නේ?” ටොමී ඇහුවා.

“මට ලේන්සුව ඕනි නෑ මම මගෙ සූකිරි බේරා ගත්තනේ” කියලා මෙනුදි ඉඳිකටුව අතට අරන් ලේන්සුව දුන්නා සූකිරිටයි ටොමීටයි සෙල්ලම් කරන්න.

පුංචි සූකිරියි ටොමියි දෙන්නම හරිම ආදරෙන් මෙනුදිට තුරුළු වුණා.





පසුවදන

නූතන තාක්ෂණික මෙවලම් භාවිතයට එකතු වීමත් සමග සිදුවන සමාජ ආර්ථික පරිවර්තනයන් හේතු කරගෙන පොතපතින් දුරස්වන පාසල් දරුවන් නැවත පොතපතට සමීප කරවීම හරහා අධ්‍යාපනයේ ගුණාත්මක වර්ධනයක් ඇති කිරීම ඔවුන්ගේ සාහිත්‍ය නිර්මාණ හැකියාවන් ඔප් නැංවීම තුළින් රටේ සාහිත්‍ය ප්‍රබෝධයක් ඇති කිරීම වැනි බහුවිධ පරමාර්ථ ඇතිව 2014 වසරේදී මා විසින් අධ්‍යාපන අමාත්‍යාංශයට පෞද්ගලික යෝජනාවක් ලෙස පාසල් දරුවන් ග්‍රන්ථකරණයට යොමු කරන ක්‍රියා මූලික පර්යේෂණ ව්‍යාපෘතිය හඳුන්වා දෙන ලදී ඒ යටතේ වැඩිම ග්‍රන්ථ ප්‍රමාණයක් රචනා කරමින් වාර්ථාවක් තබන්නේ මහමායා පුංචි ගත්කතුවරියන් ය පාසල තුළ ගොඩනැගී ඇති ලේඛන සංස්කෘතිය නව මාවතකට යොමු කරමින් රටේ සෙසු පාසල් දරුවන් හා එක්ව මෙවර ජාත්‍යන්තර පාඨකයන් වෙත ලගාවීමට නූතන තාක්ෂණය හා බැඳුණු විද්‍යුත් කෘති රචනා කරන්නට විය ඒ තුළින් සම්පාදනය වූ මෙම විද්‍යුත් කෘතිය දරුවන්ට අත්දැකීම් සමුදායක් ලබා දෙමින් අධ්‍යාපනයේ ගුණාත්මක දියුණුවට ඉවහල් වන අතරම ඔවුන්ගේ හැඟීම් දැනීම් නිර්මාණාත්මක හැකියාවන් ශාස්ත්‍රීය හික්මීම ප්‍රදර්ශනය කරන කැඩපතකි මෙම නිර්මාණ රටේ අධ්‍යාපනයේ දිශාන්තිය මෙන්ම සමාජ ප්‍රගමනයට මග පෙන්වන නිසා ප්‍රතිපත්ති සම්පාදකයින් සහ සැලසුම්කරුවන්ට මෙන්ම සමාජයේ වගකිවයුතු පාර්ශවයන්ට ආලෝකයක් සපයයි පාසල් මට්ටමින් ආරම්භ කර ජාතික තලය දක්වා විවිධ අභියෝග මැද පැමිණි මෙම ව්‍යාපෘතියේ ජීවය වූයේ මහමායා දියණියන් සහ පාසල් ප්‍රජාව බව ගෞරවයෙන් සිහිපත් කරමි

දිවිය දිනන විද්‍යුත් පොතක් ව්‍යාපෘතියට මහමායා දියණියන් සමග විද්‍යුත් කෘතියක් රචනා කර ජනගත කරන්නට වේදිකාවට පිවිසි ගත්කතු අංකුර ඔබට ලෝකය දිනන ගත්කතුවරයෙකු වීමට ශක්තිය ලැබේවායි පතමු

මෙයට

සෙනවිරත්න මහලේකම්

පාසල් දරුවන් ග්‍රන්ථකරණයට යොමු කළ ව්‍යාපෘතියේ නිර්මාපක

2023 11 01